**ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ විගණන මතය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලොචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------------

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැය විෂයයන් 27 ක් සඳහා එකතුව රු.මිලියන 8,993.71 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 5,968.86 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | සළසා ගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | පිළිගනිමි. අපේක්ෂිත වියදම් සිදු නොවීම, ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම, පුරප්පාඩු තනතුරු සඳහා නව බඳවා ගැනීම් සිදු නොවීම, මූල්‍ය කල්බදු ක්‍රමයට මිලදී ගැනීම් සිදු කිරීම වැනි හේතු මේ සඳහා බලපා ඇත. |

**1.6.2** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනයේ මූලධන වත්කම් වර්ෂය තුළ අත්පත් කරගැනීම්වල වටිනාකම රු.5,963,531,356 ක් ලෙස දක්වා තිබුණ ද මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම්වල වටිනාකම රු.4,873,554,230 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 1,089,977,126 ක වෙනසක් නිරීක්ෂණය විය. | වත්කම්වල වටිනාකම් ගිණුම් ගත කිරීම නිවැරදිව ඉටු කළ යුතු වීම. | භාණ්ඩාගාරයෙන් ලද උපදෙස් අනුව 2018 වර්ෂයේ මැයි මස දක්වා මිලදී ගන්නා ලද වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ ආරම්භක ශේෂය ලෙස ගිණුම් ගත කරන ලදී. මේ නිසා වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ වර්ෂය තුල මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකම සහ මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම ලෙස දක්වා ඇති වටිනාකම සමඟ සංසන්ධනය නොවන බව පිළිගනිමි. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂය ආරම්භයට දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.35,044,134,234 ක් බව දක්වා තිබුණ ද මූල්‍ය තත්ත්වය පිළිබද ප්‍රකාශනයේ එදිනට වූ දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.24,185,806,846 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.10,858,327,388 ක වෙනසක් නිරීක්ෂණය විය. | වත්කම් පිළිබද ගිණුම් තැබීමේ දී ආරම්භක ශේෂයට නිවැරදිව සටහන් කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2018 මැයි 31 වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු වත්කම්වලින් බොහෝ ප්‍රමාණයන් තක්සේරු කර ආරම්භක ශේෂයක් ලෙස එම වර්ෂය තුළ ගිණුම් ගත කරන ලදී. ඒ අනුව 2018 මැයි 31 සිට 2018 දෙසැම්බර් 31 දක්වා තක්සේරු කර ආරම්භක ශේෂය ලෙස ගිණුම්ගත කළ මුළු වටිනාකම රු.35,044,134,234 ක් වේ.<br><br>මෙම තක්සේරු කරන ලද වටිනාකම් ගිණුම් CIGAS |

| | | | |
|---|---|---|---|
| | | | වැඩසටහනේ ආරම්භක ශේෂය ලෙස ඇතුළත් කරන ලදී. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය මුළු මුදල රු.518,296,185 ක් වූ අතර එයින් අයවීම් හිඟ හිට තිබුණු ණය මුදල රු.23,767,567 ක් විය. තවද ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන්, සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් සහ සේවය අත්හිට වූ නිලධාරීන්ගෙන් අයවීම් නතර වී හිඟ හිටව තිබුණු ණය මුදල් 2016 සහ 2017 යන වර්ෂවලට සාපේක්ෂව 2018 වර්ෂයේ දී ඉහළ ගොස් තිබීම හේතුකොටගෙන එම ණය ආපසු අයකර ගැනීමේ ප්‍රගතිය ඉතාමත් අසතුටුදායක මට්ටමක පැවතුණි. | හිග හිටි ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ මැයි මස දක්වා එම හිග හිටි ණය ශේෂවල අයවීම රු.9,237,173 ක් වන අතර එය හිග හිටි ණය ශේෂවලින් අයවීමේ ප්‍රතිශතය සියයට 39 ට ආසන්න අගයක් ගනී. එම ණය ශේෂ අයකරගැනීමේ කටයුතු කෙරෙහි 2019 වර්ෂයේදී වැඩි අවධානයක් යොමු කර ඇත. |
| (ii) | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.4 ඡේදය ප්‍රකාරව ලබාගත් ණය සම්පූර්ණයෙන් අය කරගැනීමට පෙර නිලධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් රජයට අයවිය යුතුව තිබෙන සියලුම ණය මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට තිබෙන ඕනෑම මුදලකින් අඩු කරගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු වුව ද 2018 දෙසැම්බර් 31 දින වන විට මිය ගිය සේවකයන් 24 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,912,946 ක් වූ ණය මුදල සම්බන්ධයෙන් එ පරිදි කටයුතු කර නොතිබුණි. ඉන් ණයකරුවන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.372,094 ක ණය | ආයතන සංග්‍රහයේ **XXIV** වන පරිච්ඡේදයේ 4.4 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වර්ෂ 05 කට වැඩි නිලධාරීන් දෙදෙනෙකුගේ මරණ පාරිතෝෂික සකස් කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. එක් නිලධාරියෙකුගේ මරණ පාරිතෝෂික සකස් කිරීමට අවශ්‍ය තොරතුරු කලාප කාර්යාලයෙන් හා ප්‍රාදේශීය කාර්යාලයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. අනෙකුත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම සඳහා ලිපිගොනු විශ්‍රාම වැටුප් |

| | | |
|---|---|---|
| මුදල වර්ෂ 05 කට වඩා පැරණි ඒවා විය. | | දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. විශ්‍රාම වැටුප් සකස් කිරීමේ ගැටළු සහගත තත්ත්වයේ පසුවන, ණය ශේෂ අයවිය යුතු අනෙක් නිලධාරීගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම සම්බන්ධව කටයුතු කෙරෙමින් පවතී |

**1.6.4** තැන්පතු
-----------

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------- | -------------------------- |
| පොදු තැන්පත් ගිණුමේ ඇති රු.1,495,013 ක් වූ පොදු තැන්පතු සඳහා වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණ ද එම තැන්පතු මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් පිළිබඳව මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගෙවීම සඳහා ඉදිරිපත් වී නොමැති අතර ඉදිරියේ දී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.5** අග්‍රිම ශේෂය
--------------

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | -------------- | ------------------------------ |
| අග්‍රිම ගිණුමකට අදාළව 2017 වර්ෂයේ සිට එන රු.2,495,604 ක ශේෂයක් නිරවුල් වී නොතිබුණි. | අග්‍රිම ශේෂය පියවීමට කටයුතු කළ යුතු වීම. | රු.2,495,604.00 ක ශේෂය දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් අත්තිකාරම් මුදලක් නොවන අතර, අංක 658 දරන නඩු තීන්දුව ප්‍රකාරව ගාල්ල දිසා අධිකරණය විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 7042385 දරන ගිණුමෙන් ලබාගෙන පැමිණිලිකාර පාර්ශ්වය වෙත ගෙවා ඇති මුදලකි. මෙම මුදල භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල නොපිය වූ අග්‍රිම ශේෂයක් ලෙසද දක්වා ඇති බැවින්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ අග්‍රිම ශේෂයක් ලෙස දක්වා ඇත. |

**1.6.6.** අධිවැය

--------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ක්‍රියාකාරකම්වල නිරත වී නොතිබුණත්, මූල්‍ය ක්‍රියාකාරකම්වල වියදම් ලෙස රු.46,756,782 ක් දක්වා තිබුණි. | ගිණුම් තැබීම් නිවැරදිව කළ යුතු වීම. | මෙම මුදල සකස් වී ඇත්තේ පොදු තැන්පත් ලැබීම් හා ගෙවීම්වල වෙනසිනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) යටතේ දක්වා ඇත. |

**1.6.7** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ)** | **ස්ථාවර වත්කම් ලේඛනය**<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතුය. | සිගාස් වැඩසටහන තුළ 2018 වර්ෂය දක්වා පැවති ස්ථාවර වත්කම් සඳහා අදාල ලේඛන හා පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛන මේ වන විට සකසා අවසන් කර ඇත. |
| **(ආ)** | **පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය**<br>2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. | -එම- |

**(ඇ) ඇප ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | පිළිගෙන ඇත. 2019 වර්ෂයේදී පවත්වාගෙන යාමට කටයුතු කරන බව දැනුම් දී ඇත. |

**(ඈ) ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647(ඈ) ප්‍රකාරව ඉන්ධන හා ලිහිස්සි තෙල් තොග පොතක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඈ) ප්‍රකාරව ඉන්ධන හා ලිහිස්සි තෙල් තොග පොතක් පවත්වා ගත යුතුය. | පිළිගෙන ඇත. 2019 වර්ෂයේදී පවත්වාගෙන යාමට කටයුතු කරන බව දැනුම් දී ඇත. |

### 1.6.8 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| 1.6.9 | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම** | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019.07.01 දින සිට දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන කාර්යාලයේ වාරිමාර්ග ඉංජිනේරුවරුන් වෙත ලබා දී තිබූ මූල්‍ය බලතල ගණකාධිකාරීවරුන් වෙත පවරන ලදී. තවද ප්‍රාදේශීය කාර්යාලවල මූල්‍ය පාලන ක්‍රම වේදය සකස් කිරීම සඳහා නව ගණකාධිකාරීවරු 16 දෙනෙකු පත් කිරීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතී. |

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>------------<br><br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව<br>---------------------------- | | අනුකූල නොවීම<br>----------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>-------------------- | | | |
| (i) | XIX වැනි පරිච්ඡේදයේ 6.13.1 සහ 7.1 වගන්තිය | රජයේ නිල නිවාස භාවිතා කරන ලද නිලධාරීන් සේවයෙන් විශ්‍රාම ගැනීමේදී, ස්ථාන මාරුවීම හෝ සේවයඅතහැර යාමේ දී එම නිල නිවාස වෙන් කර දෙන බලධාරියා වෙත නැවත භාරදියයුතු වුවද දෙපාර්තමේන්තුවේ නිල නිවාස 16 ක් එපරිදි භාර දී නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් සේවයෙන් විශ්‍රාම යාමේදී හා ස්ථාන මාරු වී යාමේදී නිල නිවාස භාර නොදීම සම්බන්ධයෙන් කටයුතු සිදුකරන ලද අතර සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. |
| (ii) | XXIV වන පරිච්ඡේදයේ 3:18:1 වගන්තිය | වැටුප් රහිත නිවාඩු ලබාදීමට පෙර ලබාගත් ණය පියවාගත යුතු වුව ද විදේශගත වූ නිලධාරීයෙකුයෙන් අයවිය යුතු රු.119,440 ක ණය සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.18.1 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ වන විට විදේශ ගත වී සිටින කේ.ආර්.ඩී. ගමගේ මයාගෙන් අයවිය යුතු රු.119,440 ක මුදල ගෙවන ලෙස දන්වා ලිපියක් යවා ඇත. |
| (iii) | XXIV වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය | විශ්‍රාම ගිය නිලධාරීන් 179 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය මුදල රු.15,833,988 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේදී රු.6,150,662.23 ක ණය ශේෂයක් අයවී ඇත. එම අයවීම මුළු විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂයෙන් 1/3 කට වඩා වැඩි ප්‍රමාණයකි . |

| | | | | |
|---|---|---|---|---|
| | | කර නොතිබුණි. මේ අතරින් නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 951,962 ක් වූ ණය මුදල වසර 05 කටත් වඩා පැරණි ණය ශේෂ විය. | | දෙවන කාර්තුව තුළදී මේ තත්ත්වය තවදුරටත් වැඩි කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 118 සහ 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛය | ස්ථාන මාරු වී ගොස් මාස 02 ක ඇතුළත ඔවුන්ගේ ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කළ යුතු වුව ද දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථානමාරු වී ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,017,262 ක ණය මුදලක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දෙපාර්තමේන්තුවෙන් පිටත අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් අය කිරීමට කටයුතු කරමින් පවතී |

**1.6.10 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උස්ගල සියබලාංගමුව වැවේ සිට මහගල්ගමුව වැව දක්වා පෝෂිත ඇළ ඉදිකිරීමේ දී යන්ත්‍ර සැපයුම්කරුවන් සමග එළඹී තිබුණු යන්ත්‍ර සැපයීමේ ගිවිසුම් කාලය අවසන් වීමට පෙර එම ගිවිසුම් අවලංගු කර වැඩි මිල ගණන් යටතේ එම යන්ත්‍ර සැපයුම්කරුවන් සමඟම නව ගිවිසුම්වලට එළඹීම හේතුවෙන් රු.1,162,110 ක අලාභයක් සිදු වී තිබුණි. | එළඹුණු ගිවිසුම් අවලංගු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ඉල්ලීම් හා අනුමැතිය ලබා ගත යුතු වීම හා සිදු වී ඇති අලාභය සම්බන්ධව විධිමත් පියවර ගැනීම. | උස්ගල සියඹලන්ගමුව පෝෂිත ඇල ඉදිකිරීම සඳහා 2015 වර්ෂයට ලියාපදිංචි වී සිටි යන්ත්‍ර සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එලඹී වැඩකරගෙන යන ලදි. එහෙත් ඉන්ධන මිල ගණන්, යන්ත්‍ර අමතර කොටස් හා යන්ත්‍රවලට අදාල අනෙකුත් සේවා හා ගාස්තු මිල ගණන් අධිකව ඉහල යාම හේතු කොට ගෙන එම මිල ගණන් යටතේ තවදුරටත් යන්ත්‍ර සැපයීම අපහසු බව එම සැයුම්කරුවන් දන්වන ලදි. මේ නිසා ගල්ගමුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා මෙන්ම කුරුණෑගල කලාපයේ අනෙකුත් කොට්ඨාශ වාරිමාර්ග ඉංජිනේරුවරුන් විසින්ද නව මිල ගණන් අනුමත කරදෙන ලෙස කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂ වරයා වෙතින් ඉල්ලීම් කර ඇත. |

ඒ අනුව 2016 වර්ෂයේදී නව මිල ගණන් කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් අනුමත කර දී ඇති අතර එම නව මිලගණන් යටතේ නව ගිවිසුම්වලට එලබීමට ගල්ගමුව වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් කටයුතු කර ඇත. ඒ වන විට පැරණි මිලගණන් යටතේ එළඹ තිබූ ගිවිසුම්වල කාලය හා පැය ගණන් ඉතිරිව තිබුණද ඒවා අවලංගු කර නව ගිවිසුම්වලට එළඹ ඇත. පැරණි ගිවිසුම් අවලංගු කර නව මිලගණන් යටතේ ගිවිසුම්වලට එලඹීමට හේතු වී ඇත්තේ ඉහත සඳහන් කරුණුවලට අනුව බව කාරුණිකව දන්වමි.

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 වියදම් කළමනාකරණය
-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන් කිරීම් සිදු කිරීම සහ සැලසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම යන හේතු නිසා වැය විෂයයන් 25 ක් සඳහා වෙන් කර තිබුණු එකතුව රු.13,749,346,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු3,416,502,624 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 59 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | අග්‍රිම ලබා ගැනීමට පෙර නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරියේදී ඇස්තමේන්තුවලට අනුකූලව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රතිපාදන අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගැනීමකින් තොරව වැය විෂයයන් අතර වෙන් කිරීම් මාරු කිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා වෙනත් වැය | ප්‍රතිපාදන අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මුදල් රෙගුලාසි 66 හා | අපේක්ෂිත දේපල ණය අයදුම්පත් ප්‍රමාණය වර්ෂය තුල නොලැබීම හා අග්‍රිම ප්‍රමාණවත් නොවීම මත වැය කිරීම සිදු නොවීම |

| | | | |
|---|---|---|---|
| | විෂයයන්ගෙන් මාරු කර තිබුණු රු.1,015,000 ක් වූ මුළු මාරුකිරීම් සම්පූර්ණයෙන් ම ඉතිරි වී තිබුණි. | 69 ප්‍රකාරව මාරු කිරීම් කළ යුතු වීම. | හේතුවෙන් ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී ඇත. |
| (ඇ) | මූලධන වියදම්වල ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවකින් ලබා ගෙන තිබුණු රු.500,000,000 ක් වූ මුළු ශුද්ධ වෙන් කිරීම ම ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර නිවැරදිව සැලසුම් සකස් කර ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | යාන් ඔය ව්‍යාපෘතියට වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි වී ඇත. වර්ෂය තුල ප්‍රමාණවත් පරිදි අග්‍රිම ලැබුනේ නම් මෙම රු.මි.500 ක අමතර ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි නොවන බව කාරුණිකව දන්වමි. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැදී සිටිය යුතු වුව ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත ප්‍රතිපාදනය ඉක්මවා රු.20,578,773 ක් වූ බැදීම් ඇති කරගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා අතර, සියළු කලාප කාර්යාල වෙත මේ පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධ ලිපියක් සකස් කර යැවීමට කටයුතු කර ඇත. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ නිලධාරින් 7 දෙනෙකු වෙත ලබා දී තිබුණු එකතුව රු.200,029 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම සඳහා අත්තිකාරම් | අත්තිකාරම් නිකුත් කළ කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් පියවීම කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා අතර, සියළු කලාප |

| | | |
|---|---|---|
| ලබාගත් කාර්යය නිම වී මාස 03 ත් මාස 8 ත් අතර කාලයක් දක්වා ප්‍රමාද කර තිබුණි. | | කාර්යාල වෙත තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතු බව දන්වා උපදෙස් ලිපියක් යොමු කිරීමට කටයුතු යොදා ඇත. |

**2.4 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක කාර්යාල 04 ක් විසින් නඩත්තු කර තිබුණු බැංකු ගිණුම් 04 ක රු.7,932,630 ක ශේෂයක් පැවති අතර 2017 දෙසැම්බර් 31 සිට 2019 අප්‍රේල් දක්වා මෙම ගිණුම් අක්‍රියව පැවතුණි. | අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කළ යුතු වීම. | මෙම ගිණුම් වැසීම සඳහා බැංකුවෙන් අවශ්‍ය තහවුරු ලිපි ලබා ගැනිමට ලිපි ඉදිරිපත්කර ඇත. එම ලිපි ලැබූ පසු එම ගිණුම් වසා දැමීමට කටයුතු කරමි. |
| (ආ) බැංකු ගිණුම් 11 ක තොරතුරු තත්ත්ව වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි. | පවත්වාගෙන යනු ලබන සියළුම ගිණුම් පිළිබද තොරතුරු තත්ත්ව වාර්තාවට ඇතුළත් කළ යුතු වීම. | මෙම ගිණුම් DSWRP හා CRIP ව්‍යාපෘතිවලට අදාල ව්‍යාපෘති ගිණුම් බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නැත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යෝජිත ගොඩිගමුව ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දී රු. මිලියන 25 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද එම ප්‍රතිපාදනවලින් | ඇස්තමේන්තු සකස් කර ලබා ගත් ප්‍රතිපාදන එම කාර්යය සඳහා | පරිසර අධ්‍යයන වාර්තාව නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවලට අනුමැතිය ලැබී නොතිබුණු අතර තාවකාලික |

| | | |
|---|---|---|
| රු.මිලියන 22 ක් එම කාර්යභාරයට වැය නොකර වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණු අතර වැඩබිමට පිවිසුම් මාර්ගයක් පමණක් ඉදි කර තිබුණි. | යෙදවීම කළ යුතු වීම. | පිවිසුම් මාර්ගය ඉදිකිරීමට පමණක් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.මි. 25 න් රු.මි. 22 ක් යාන් ඔය ව්‍යාපෘතිය වෙත හැරවීමට පියවර ගන්නා ලදි. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සහ දැදුරු ඔය ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2014 වර්ෂය නිම වන විට අවසන් කිරීම සඳහා සැළැසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒවා අවසන් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | ආරම්භ කරන ලද ව්‍යාපෘති යෝජිත දිනට නිම කළ යුතු වීම. | දැදුරු ඔය ව්‍යාපෘතියේ අමාත්‍ය මණ්ඩල තිරණය මගින් 2018 අවසානය දක්වා දීර්ඝ කර ඇත. තවද ව්‍යාපෘතියේ වන්දි ගෙවීමේ කටයුතු හා සෙංගල් ඔය ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් ඉතිරිව පවතින බැවින් මෙම කාලය 2019-06-30 දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ඉල්ලා වාරිමාර්ග හා ජල සම්පත් කලමණාකරන අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇත.<br><br>බොහෝ අවස්ථාවල ඇතිවූ ප්‍රායෝගික තත්වයන් හේතුවෙන් ව්‍යාපෘති සැළසුම් වෙනස් කිරීමට සිදුවීමත්, ව්‍යාපෘතියට අවශ්‍ය කරන ඉඩම් අත්පත්කරගැනීම් සම්බන්ධව පැනනැගුණු ගැටලුත් යන කරුණු ව්‍යාපෘති ප්‍රමාදයට සෘජු ලෙස බලපා ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු වාහන 42 ක් බාහිර පාර්ශවයන්ට ලබා දී තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබෙන වාහන නැවත ලබා ගැනීමට හෝ එම ආයතන වෙත පවරා දීමට කටයුතු කළ යුතු වීම. | වාහන 04 ක් අපහරණය කිරීමට අනුමැතිය ලබා දී ඇත. වාහන 02 දෙපාර්තමේන්තුව වෙත ආපසු ලබා ගැනීමට හා වාහන 34 අමාත්‍යංශය වෙත පවරා දීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | රාජ්‍ය ආයතන 07 කින් ලබා දී තිබුණු රු.332,950,000 ක් වූ වාහන 89 ක් සහ රු.270,000 ක් වූ යතුරු පැදි 27 ක් පවරා ගැනීමකින් තොරව භාවිතා කර තිබුණි. | භාහිර ආයතනවලින් ලබා ගත් වාහන පවරා ගැනීමට හෝ නැවත භාර දීමට කටයුතු කළ යුතු වීම. | වාහන 04 ක් පවරා ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර අනෙකුත් වාහන පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 3.4 පාඩු හා හානි

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හානි හා පාඩු ලේඛනය අනුව රු. 23,631,882 ක් වූ හානි හා පාඩු 46 ක් සිදුවී වර්ෂ 2 සිට වර්ෂ 18 ක් දක්වා කාලයක් ගත වී තිබුණ ද ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 103 සහ 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පාඩු හා හානි 02ක් පොතෙන් කපා හැරීමට අමාත්‍යංශයට ඉදිරිපත් කිරීම, 06 ක අලාභ වැටුපෙන් සහ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට, 16 ක නීතිමය කටයුතු සිදු කිරීම හා 22 ක් පොතෙන් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය අනුමත කර තිබෙන මිල ගණන්වල අනුපිළිවෙල නොසලකා ගල්ගමුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් යන්ත්‍ර සැපයුම්කරුවන් සමග ඉහළ මිල ගණන් යටතේ අවස්ථා 14 ක දී ගිවිසුම්වලට එළඹී තිබුණි. තවද ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන ඉක්මවා යන්ත්‍ර පැය 8,012 ක් භාවිතා කිරීම සඳහා යන්ත්‍ර සැපයුම්කරුවන් 19 දෙනෙකු සමග ගිවිසුම්වලට එළඹ තිබුණි. | ඉහළ මිල ගණන් යටතේ ගිවිසුම් ගත වීම පිළිබඳව වගකිව යුතු නිලධාරින්ට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | කුරුණෑගල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලගණන් අනුපිළිවෙලට ලැයිස්තුවක් ලබා දී තිබුණි . ඒ අනුව මුලින්ම අඩු මිල ගණන් ඉදිරිපත් කල අයට යන්ත්‍ර සපයන ලෙස ගල්ගමුව වාරිමාර්ග ඉංජිනේරුවරයා දැනුම් දී ඇතත් ඔවුන්ගේ යන්ත්‍ර වෙනත් ස්ථානවල සේවයේ යොදවා තිබීම සහ විවිධ වූ හේතූන් මත ඔවුන් යන්ත්‍ර සපයා නොමැත. මේ හේතුවෙන් ලැයිස්තුවේ ඊ ලගට සිටින සැපයුම්කරුවන් සමඟ කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයෙන් අනුමත කරන ලද මිල ගණන් යටතේ ඔවුන්ගේ සේවය ලබාගෙන ඇත. ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන ඉක්මවා යන්ත්‍ර සේවයේ යොදවා නොමැත. |
| (ආ) | **දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය** | | |
| i. | ජල විදුලි ජනන ස්ථානයක් සෑදීමට අවශ්‍ය උමං මාර්ග සැකසුව ද විදුලි ජනන යන්ත්‍ර සවි කිරීමට කටයුතු කර නොතිබුණි. | ජලාශය සැලසුම් කිරීමේ දී ශක්‍යතා අධ්‍යයනය ඉටු නොකර ජලාශයේ වැඩ ආරම්භ කිරීම පිළිබඳව විධිමත්ව සොයා බැලිය යුතු වීම. | ජල විදුලි බලාගාර සවිකිරීමට කටයුතු කරමින් පවතී. |
| ii. | ජලාශයේ සීමා වෙන්කිරීමට මිලදී ගෙන තිබූ මායිම් කනු භාවිතා නොකර නිෂ්ක්‍රීයව තිබුණි. | මිලදී ගත් මායිම් කනු අවශ්‍යතාවය පරිදි පරිහරණය කළ යුතු වීම. | මිලදී ගෙන ඇති මායිම් කණු ඉදිරියේදි සවිකිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| iii. | ඇළ මාර්ගය ඉදි කිරීමේ දී ඉවත් කරන ලද කළු ගල් හා පස් ඇළ මාර්ගය අසල රඳවා තිබුණු අතර එවා ඇළ මාර්ගයට වැටීම නිසා ඇළ මාර්ගයේ පන් ශාක වැවී තිබුණි. තවද සැලසුම් කළ පරිදි ඇළ මාර්ගය දෙපස නියමිත පරිදි සකස්කර තණ පිඩලි ඇල්ලීම සිදු කර නොතිබුණි. | සිදුවිය හැකි අලාභය අවම කර සැලසුම් කළ පරිදි ඇළ මාර්ග දෙපස පිළිසකර කරවා ගැනීම. | ඇල මාර්ගයන් සඳහා පස් කැපීමේදි ඉවත් කරන ලද ගල් හා පස් දැමීමට කි.මී 05 ක් ඇතුලත පිහිටි ක්‍රීඩා පිට්ටනි සකස් කල යුතු මාර්ග ආදීය යොදා ගත් අතර යම් ප්‍රමාණයක් ප්‍රදේශයේ තෝරා ගත් ඉඩම් වලටද දැමීමට කටයුතු කරන ලදී. එහෙත් ප්‍රදේශවාසීන්ගේ එල්ල වූ විරෝධතාවන් හේතුවෙන් එසේ දැමීමට නොහැකි වූ පස් ඇල දෙපස ඉවුර දිගේ තුනී කර මාර්ගයක් වන පරිදි තලා සකස් කරන ලදී. එහිදි කිසියම් සුළු ප්‍රමාණයක් පස් ඇල තුලට වැටීමට හැකි වුවද ඇලෙහි ජලය ගලා යාමට බාධාවක් වන තරමට එසේ සිදුවී නොමැත. එසේ ගස් ඇති වී ඇත්නම් එම ස්ථාන පරීක්ෂා කර ඉවත් කිරීමට කටයුතු කරනු ලබයි. |
| iv. | ඇළ මාර්ගය ඉහළින් සහ අනෙකුත් ස්ථානවල ඉදි කර තිබුණු උඩපැන්නුම් කොටස් **(Turf)** නියමිත ප්‍රමිතියට අනුව ඉදි නොකිරීම හේතුවෙන් ජලය කාන්දුවන අවස්ථා සහ කොන්ක්‍රීට් බැම් පුපුරා ඇති අවස්ථා නිරීක්ෂණය විය. | නිවැරදිව ඉදිකිරීම් කටයුතු නොකළ පාර්ශවයන් පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීම හා කඩිනමින් පිළිසකර කර අලභය අවම කරවා ගැනීම. | අදාල ස්ථාන අලුත්වැඩියා කිරීමට කටයුතු සැලසුම් කර ඇත. |
| v. | දැඳුරු ඔය ජලාශයේ ජල ධාරිතාවය සහ එක් එක් ජල මට්ටම්වල දී ජලයට යටවන භූමි ප්‍රමාණය, භෞතික සම්පත් සහ ජලාශයේ එක් එක් ප්‍රදේශවල ගබඩාවන ජල ධාරිතාවය, ජලයේ පැතිරීම, ජලාශය ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වයට ඇතිවන බලපෑම, දේපල වලට සිදු කරන බලපෑමේ වටිනාකම ගණන් බැලීම සඳහා ජලාශයේ පතුලේ | විධිමත් පරිදි කටයුත් නොකිරීමට හේතු සොයාබලා පිළියම් යෙදීම හා සිදුවිය හැකි අලාභය අවම වන අයුරින් කඩිනමින් පියවර ගැනීම . | දැදුරු ඔය එක් එක් මට්ටම් වලදී ජල ධාරිතාව මැනීම සඳහා වර්ගඵල - ධාරිතා සටහනක් ශක්‍යතා අධ්‍යයනයේදී සකස් කර ඇත. එසේම ජලාශයට යටවන භූමි ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා මිනින්දොරු දෙපාර්තමේන්තුව ලවා සිතියමක් සකස් කරවා ගෙන ඇති අතර එම සිතියමේ ප්‍රකාරව උපරිම ගංවතුර මට්ටමේදී හා උපරිම පිරි සැපයුම් මට්ටමේදී ජලයෙන් යටවන භූමිය හඳුනාගැනීමට කටයුතු සිදු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | මිණුම් පිළිබඳ වාර්තාවක් (Tank bed Server Report) පිලියෙල කළ යුතු වුව ද එ පරිදි කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | සියඹලාංගමුව වැවේ සිට මහගල්ගමුව වැව දක්වා පෝෂිත ඇළ ඉදිකිරීමේදී ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන ඉක්මවා යන්ත්‍ර පැය 9,926 ක් භාවිතා කිරීම සඳහා යන්ත්‍ර සැපයුම්කරුවන් 20 දෙනෙකු සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා හේතු සොයා බැලීම හා සිදු විය හැකි අලාභය තක්සේරු කර එය අවම කර ගත යුතු වීම. | කළමනාකරණ වාර්තාවේ ඇතුළත් ඡේදයකි. පිළිතුරු ලබා දීමට කල් තිබේ. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------- | -------------------------------- |
| වාරි ව්‍යාපාරවල ගොවි ජනතාවගේ ආර්ථික තත්ත්වය ස්ථාවර කිරීම සඳහා නිසි අයුරින් සැකසුන වාරි පද්ධතියක් ස්ථාපිත කිරීම දෙපාර්තමේන්තුවට අදාළ තිරසාර සංවර්ධන අරමුණක් විය. එහෙත් වැසි කාලයේ දී දැදුරු ඔය ජලාශයට එක්රැස්වන අතිරික්ත ජලය දැදුරුඔයට මුදාහැරීම සඳහා ඉදි කර තිබෙන සොරොව් දොරවල් 08 වසා තිබුණ ද එම දොරවල් අතරින් නිරන්තරයෙන් ම ජලාශයේ ජලය විශාල හඬක් නගමින් දැදුරුඔයට ගලා යමින් තිබුණි. එම කරුණ හේතුකොට ගෙන රු.මිලියන 12,342 ක් වැය කර ඉදි කර තිබුණු දැදුරු ඔය ජලාශය තුළ රැස් කරන ජලය සාගරයට ගලා යමින් තිබුණි. . | දෝෂ සහිතව ජලාශය ඉදිකිරීම පිළිබද කඩිනමින් සොයාබැලීම හා සිදුවිය හැකි අලාභය අවම කරවා ගැනීම. | රේඩියල් ගේට්ටුවල ජලකාන්දුව වැලැක්වීම සඳහා යොදා ඇති රබර් බීඩිං වල ඇති අඩුපාඩුවක් නිසා ජල කාන්දුවක් පවතින අතර එය ජලාශයෙන් දැදුරුඔයට අනිවාර්යයෙන් මුදාහල යුතු ජල ප්‍රමාණයට වඩා අඩු වේ. මේ නිසා මෙයින් ජලය අපතේ යාමක් සිදු නොවන අතර මෙම ජලය රිදී බැදි ඇල්ල හරහා මාගල්ල ජලාශයට ගොස් ඒවායේ ජල අවශයතාවය සපුරාලනු ලැබේ. කෙසේ වුවද රේඩියල් ගේට්ටුවල ජල කාන්දුව වැලැක්වීමට යොදා ඇති රබර් බීඩින්වල දෝෂයන් එම ඉදිකිරීම් කල රජයේ කර්මාන්ත ශාලාව ලවා නිවැරදි කිරීමට මේවන විට කටයුතු කරමින් පවතී. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 93 ක, තෘතීයක මට්ටමේ තනතුරු 138 ක, ද්විතියක මට්ටමේ තනතුරු 637 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 890 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම හෝ අතිරික්ත තනතුරු වේනම් ඒවා යටපත් කළ යුතු වීම. . | බඳවා ගැනිම් සඳහා ඉල්ලීම් කර ඇත. 2019 වර්ෂය තුළ ද්විතියික මට්ටම සඳහා තාක්ෂණික සහයක 100 දෙනෙකුට පත්වීම් ලිපි ලබා දීමට කටයුතු කරන ලදී. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සේවය කර 2018 දෙසැම්බර් 31 දිනවන විට විශ්‍රාම ගොස් තිබුණු නිලධාරින් හා සේවකයන් 53 ගේ විශ්‍රාම වැටුප් සැකසීම සඳහා කටයුතු කර නොතිබුණි. ඉහත විශ්‍රාම වැටුප් සකස් නොකළ නිලධාරින් 53 ක් අතරින් 04 දෙනෙකු නිල නිවාස භාර නොදීම නිසා විශ්‍රාම වැටුප් ගණනය කර නොතිබුණු අතර වයස අවුරුදු 45 පසු වී සේවයට බඳවාගැනීම නිසා සේවකයින් 05 දෙනෙකුගේ විශ්‍රාම වැටුප සකසා නොතිබුණි. වැන්දඹු අනත්දරු අංකය ලබා නොගැනීම මත සේවකයන් 03 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් සකස් කර නොතිබුණි. | සේවකයින්ගේ ලිපි ගොනු යාවත්කාලීනව නඩත්තු කළ යුතු අතර ලබා දී තිබෙන නිල නිවාස පිළිබඳව ආයතන සංග්‍රහයේ **XIX** වැනි පරිච්ඡේදය අනුව කටයුතු කළ යුතු වීම. | විශ්‍රාම ගිය 33 දෙනෙකුගේ ලිපි ගොනු 2019 අගෝස්තු 31 දින වන විට සකස් කර ඇති අතර ඉතිරි ලිපි ගොනු සකස් කිරීමට පියවර ගෙන ඇත. |